කාර්ය සාධන වාර්තාව

2018

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල් අමාත්‍යාංශය

පටුන

රාජ්‍ය මූල්‍ය සමාලෝචනය 4
සමස්ථ විශ්ලේෂණය 4
අරමුණු 4
දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් 4
මූල්‍ය ක්‍රම පද්ධති අංශය 5
අරමුදල් අංශය 6
ප්‍රසම්පාදන අංශය 6
ආයතනික සංවිධාන ව්‍යුහය 7
2018 වර්ෂයේ කාර්යසාධනය 8
1. මුදල් රෙගුලාසි වලට අදාළ ක්‍රියාකාරකම් 8
1.1 නව මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත 8
1.2 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 8
1.3 රාජ්‍ය ආයතන වලට අදාළ විගණන විමසුම් හා විගණන වාර්තා සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග 9
1.4 රජයේ ගාස්තු හා අයකිරීම් 9
1.5 පාඩු හා කපා හැරීම් 11
1.6 රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය 13
1.7 2018 වසර තුලදී මුදල් රෙගුලාසි අංක 494 යටතේ මුද්දර ගාස්තු ලෙස අයකර ගන්නා ලද ආදායම් වෙන්කිරීම 13
1.8 ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් පත් කිරීම 2018 - 14
2 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2018 - 14
2.1 2018 අයවැය යෝජනාවලියේ අංක 261 යෝජනාව අනුව ගාස්තු හා අයකිරීම් ප්‍රතිශෝධනය සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2018 නිකුත් කිරීම. 14
2.2 2018.08.27 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරීම 15
2.3 2018.10.23 දිනැති අංක 05/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරීම 15
2.4 2018.11.19 දිනැති අංක 06/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය 15
2.5 2018.11.26 දිනැති අංක 07/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය 15
3 ප්‍රසම්පාදන කළමනාකරණය 16
3.1 2018 වර්ෂයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තීන් සඳහා කරන ලද සංශෝධන 16
3.2 විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය (e - GP) 17
4 අරමුදල් කළමනාකරණය 18
5 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම 20
6 පාලන හා මූල්‍ය අංශය 22
6.1 කාර්යමණ්ඩල 22
6.2 2018 වර්ෂයේ ස්ථාන මාරු වි පැමිණි නිලධාරීන් 22
6.3 2018 වර්ෂයේ ස්ථාන මාරුවීම් ලැබ පිටතට ගිය නිලධාරීන් 23
6.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් 23
7 මූල්‍ය කළමනාකරණය 28
7.1. කාර්යාලය යළි සකස් කිරීම 28
7.2. රාජ්‍ය සේවකයින්ගේ අනුමත අත්තිකාරම් "බී" ගිණුම 28

වගු හා සටහන්

වගු අංක 01	2018 වර්ෂය තුළ සංශෝධිත ගාස්තු හා අයකිරීම්	10
වගු අංක 02	2018 වර්ෂය තුළ පාඩු හා කපාහැරීම්	11
වගු අංක 03	2018 වර්ෂය තුළ මුද්දර ආදායම	13
වගු අංක 04	රාජ්‍ය මුදල් චක්‍රලේඛ	14
වගු අංක 05	2018 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද අමාත්‍ය මණ්ඩල මට්ටමේ ප්‍රසම්පාදන	17
වගු අංක 06	වසා දැමීමට තීරණය කොට ඇති අරමුදල් ලැයිස්තුව	19
වගු අංක 07	අංශයන් අනුව අමාත්‍ය මණ්ඩල නිරික්ෂණ ලැයිස්තුව	20
වගු අංක 08	2018.12.31 දිනට අනුමත හා සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය	22
වගු අංක 09	2018 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්	22
වගු අංක 10	2018 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන්	23
වගු අංක 11	2018 වර්ෂය තුළ විදේශ පුහුණුවීම්	23
වගු අංක 12	2018 වර්ෂය තුළ දේශීය පුහුණුවීම්	26
වගු අංක 13	2018 වර්ෂයේ වියදම්	28
වගු අංක 14	අත්තිකාරම් "බී " ගිණුම	28
සටහන් 01	2018 වර්ෂයේ විවිධ ආර්ථික අංශයන් අනුව නිරික්ෂණ	21

දැක්ම

" රාජ්‍ය අංශයේ විනිවිදභාවය, වගවීම හා සේවා සැපයිම වර්ධනය
කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූලය කළමනාකරණ නීති පද්ධති
රාමුවක් සකස් කිරීම"

මෙහෙවර

"රාජ්‍ය අංශය තුළ මහජන වගවීමට සහාය වන ආයතනික
ක්‍රියාකාරීත්වයක් සහිත පුළුල් යහපාලන පරිසරයක් ශක්තිමත්
කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පද්ධති, පරිපාටීන් සකස් කිරීම,
සමාලෝචනය, සංවර්ධනය, පසුවිපරම හා යාවත්කාලීන කිරීම."

රාජ්‍ය මූල්‍ය සමාලෝචනය

සමස්ථ විශ්ලේෂණය

දේශීය ආර්ථිකයට ආසන්නතම බලපෑම් ඇති කරන්නාවූ රජයේ ආදායම හා වියදම කළමනාකරණය කිරීමේ රාජ්‍ය ප්‍රවේශය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ලෙස හැඳින්විය හැක. රජය සතු සම්පත් සමාජීය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවීම නොවැළක්විය හැකි කරුණක් වන බැවින් සියලුම රාජ්‍ය සම්පත් හැකිතාක් කාර්යක්ෂමව හා ඵලදායීව ,ආර්ථික හානිය හා නාස්තිය අවම වන පරිදි උපයෝගී කර ගත යුතුය. සංවර්ධන ක්‍රියාවලිය තුළ රජය හා පුරවැසියන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය හා පොදු එකඟතාවයකින් යුතු සබඳතාවක් නිර්මාණය කරන හෙයින් කාර්යක්ෂම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, ආර්ථික සංවර්ධනය උදෙසා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරයි. ඉහළ විනිවිදභාවයක් හා වගවීමක් සහිත රාජ්‍ය මූල්‍යකරණයකින් යුතුව, විශේෂයෙන්ම රටේ පුරවැසියන් සඳහා ප්‍රමාණයෙන් හා ගුණාත්මකභාවයෙන් ඉහළ සේවා උත්පාදනයක් සඳහා මෙසේ සීමිත රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති, ක්‍රියාවලි හා ආයතන ප්‍රතිශෝධනය කිරීම අවශ්‍ය වේ.

අරමුණු

(i) උපරිම වගවීමක් හා විනිවිදභාවයක් තහවුරු කරනු වස් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ප්‍රතිපත්ති, පද්ධති හා ක්‍රියාපරිපාටින් සම්පාදනය,සංවර්ධනය සමාලෝචනය පසු විපරම හා යාවත්කාලීන කිරීම (උදා :- මුදල් රෙගුලාසි, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලි හා භාවිතාවන්)

(ii) රාජ්‍ය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහතික කරනු පිණිස රාජ්‍ය අංශයේ පාලනය ප්‍රවර්ධනය කිරීම හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට (COPA) සහය වීම.

(iii) දැනට පවත්නා දෙපාර්තමේන්තු ගාස්තු හා අය කිරීම් සමාලෝචනය හා අධීක්ෂණය කිරීම සහ ඵලදායී අන්දමින් බදු නොවන ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව සොයා බැලීම.

(iv) රාජ්‍ය අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කිරීම තහවුරු කිරීම සඳහා, විවිධ කාර්යයන් උදෙසා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ස්ථාපිත අරමුදල් විධිමත් කිරීම, සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම්

2018 ජුලි 01 වන දින සිට, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සේවා සැපයුම කඩිනම් කිරීම සඳහා, රාජකාරී පැවරුම ප්‍රතිශෝධනය කොට තිබේ. ඒ අනුව, පහත සඳහන් පරිදි අමාත්‍යාංශ සමූහගත කොට ඇති අතර දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්, ආර්ථිකයේ පුළුල් අංශයන් යටතේ අමාත්‍යාංශවලට අදාළ කාර්යයන් සඳහා අනුයුක්ත කොට තිබේ.

අ) ප්‍රාදේශීය සංවර්ධනය

ආ) පාලනය

ඇ) පරිසරය

ඇ) ආරක්ෂාව

ඉ) යටිතල පහසුකම්

ඊ) විදේශ රැකියා

උ) ආගමික හා සංස්කෘතික කටයුතු

ඌ) ප්‍රාථමික කර්මාන්ත

ඔ) සමාජ සුභසාධනය

ඕ) සෞඛ්‍ය

ක) කර්මාන්ත

ග) ඉඩම්

ච) අධ්‍යාපනය

ජ) තරුණ කටයුතු

ට) විශේෂ ගෙවීම් ඒකක

පහත සඳහන් ආංශික හා ආංශික නොවන කාර්යයන් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඉටු කරනු ලැබේ.

මූල්‍ය ක්‍රම පද්ධති අංශය

- මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් යෝජනා සමාලෝචනය කිරීම හා අර්ථකථනය සැපයීම.
- නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (PFM) පනත හා රෙගුලාසි වලට අදාළ කාර්යයන් ඉටු කිරීම.
- රාජ්‍ය ආයතන (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන) පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමෙහිලා රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහය වීම.
- විගණකාධිපති වාර්තාව පරීක්ෂා කිරීම හා පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම
- රාජ්‍ය ගිණුම් කාරක සභා විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- පාර්ලිමේන්තු සැසිවාරයන්හි රාජ්‍ය ගිණුම්කාරක සභා වාර්තා මත පදනම් වෙමින් භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම.
- මුදල් රෙගුලාසි 202 යටතේ සහනදායී ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීම් සමාලෝචනය කිරීම හා අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම.
- රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ ගැටළු සමාලෝචනය කිරීම.
- රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දැනට පවතින ගාස්තු හා අයකිරීම් පිළිබඳ දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, ගැලපීම හා බෙදා හැරීම.
- රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල දැනට පවතින ගාස්තු හා අයකිරීම් ප්‍රතිශෝධනය කිරීම සඳහා වන යෝජනා නිර්දේශ නිකුත් කිරීම.

- මුදල් රෙගුලාසි යටතේ රජයේ පාඩු කපා හැරීමේ හා අත්හැර දැමීමේ ඉල්ලීම් අධ්‍යයනය කිරීම හා නිර්දේශ කිරීම.

අරමුදල් අංශය

- ව්‍යවස්ථාපිත, භාරකාර හා දෙපාර්තමේන්තු අරමුදල් වලට අදාළ මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- අරමුදල් සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.
- වාර්ෂික ගිණුම් හා විගණකාධිපති වාර්තා පරීක්ෂා කිරීම හා අරමුදල් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අරමුදල් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විධිමත් කිරීම.

ප්‍රසම්පාදන අංශය

- ප්‍රසම්පාදනය සම්බන්ධ කරුණු අධ්‍යනය කිරීම හා නිර්දේශ සැපයීම.
- රජයේ නියෝජිතායතනවල ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් ප්‍රසම්පාදනය සම්බන්ධ ගැටළු පිළිබඳ පැහැදිලි කිරීම් සම්පාදනය කිරීම හා නිකුත් කිරීම.
- ප්‍රසම්පාදන තීරණ ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටු (PC) ,තාක්ෂණික ඇගයීම් කමිටු (TEC), හා ව්‍යාපෘති කමිටු (PC), පත් කිරීම සඳහා ප්‍රසම්පාදන අස්ථීත්වයන්හට පහසුකරණය සැලසීම.
- ප්‍රසම්පාදන නිවේදන, උසස් ප්‍රසම්පාදන නිවේදන, ප්‍රසම්පාදන සැලසුම් හා කොන්ත්‍රාත් ප්‍රදානයන් අන්තර් ජාලයට මුදා හැරීම.
- විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-Gp) පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයේදී ජාතික ප්‍රසම්පාදන කොමිසම (NPC) වෙත සහාය වීම.

ප්‍රසම්පාදනය සම්බන්ධ කරුණු, මූල්‍ය රෙගුලාසි, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් (PPP) හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ කෙටුම්පත් කිරීම.

ආයතනික සංවිධාන ව්‍යුහය



අ.ජ–අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ – අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | අ – අධ්‍යක්ෂ

ස.අ- සහකාර අධ්‍යක්ෂ | ප.නි – පරිපාලන නිලධාරි | ස.නි– සංවර්ධන නිලධාරි

සැ.ස-සැළසුම් ක්‍රියාත්මක කිරීමෙ සහකාර | කළ.ස- කළමණාකරන සහකාර | භා.ප– භාෂා පරිවර්ථක

කා.කා.ස - කාර්යාල කාර්ය සහායක | රි.සේ- රියදුරු සේවය

2018 වර්ෂයේ කාර්යසාධනය

2018 වසර ඇතුළත දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම අනුව සලකා බලන විට ප්‍රශස්ත මට්ටමක පවතී. අදාළ කාල සීමාව අතරතුර දෙපාර්තමේන්තුවේ එක් එක් පරිපාලන හා ගිණුම් අංශයන් යටතේ නියාමන, ප්‍රසම්පාදන කළමනාකරණ හා අරමුදල් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කොට තිබේ.

1. මුදල් රෙගුලාසි වලට අදාළ ක්‍රියාකාරකම්

1.1 නව මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත

රාජ්‍ය අංශයේ ගණුදෙනු සිදු කිරීම සඳහා වඩාත් පුළුල් නෛතික රාමුවක් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රෙගුලාසි මඟින් සපයනු ලැබේ. ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමටත් ඒවායේ ගුණාත්මකභාවය හා ප්‍රතිඵල වැඩි දියුණු කිරීමටත් මෙම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිශෝධන වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කොට තිබේ. ලෝක බැංකුවේ උපදෙස් පරිදි පාර්ශවකරුවන් ගණනාවකගේ සහයෝගයෙන් අදාළ රෙගුලාසි සම්පාදනය කෙරෙමින් පවතී. වර්තමානයේ පවතින 1992 වසරේ මුදල් රෙගුලාසි සංග්‍රහය වෙනුවට මෙම නව රාජය මූල්‍ය කළමනාකරණ පනත අදාළ වනු ඇත.

මෙම දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව එය විශේෂඥ කමිටුවක් වෙත යොමුකර නිරීක්ෂණ ලබා ගන්නා ලදී. එම විශේෂඥ කමිටුවේ නිර්දේශ ද ඇතුළත් කර සංශෝධනය කරන ලද රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත් කෙටුම්පත නීතිමට ලේඛනයක් ලෙස සකස් කිරීම සඳහා මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අත්සනින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත 2018.11.23 දිනැතිව යොමු කරන ලදී.

1.2 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)

ඉහළ සේවා සැපයීමේ සන්දර්භයක් තුළ රාජ්‍ය අරමුදල් උපයෝගී කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් රජය විසින් පුරවැසියන්ට වගකිව යුතු වේ. එබැවින්, නීත්‍යානුකූල බව, ස්ථාවර බව, විනිවිද බව හා වගකීම් සහගත බව තහවුරු කරනු ි වස් සම්පාදනය කරන ලද පුළුල් පරාසයක නීති හා පරිපාලන ක්‍රියාපටිපාටි වලට යටත්ව රජයක් විසින් තීරණ ගැනීම සිදු කළ යුතුය.

මෙවැනි පසුබිමක, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වගන්තිය හා 125 වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය ප්‍රකාරව, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය, අදාළ ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන මත පදනම් වන විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ සන්සන්දනාත්මක ලෙස පරීක්ෂා කර බැලීම සඳහා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) පිහිටුවා ඇත. මෙම කාරක සභාව විසින් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල සහයෝගය හා මඟපෙන්වීම යටතේ මෙහි පරීක්ෂණ කටයුතු සිදු කෙරේ. COPA කමිටුව විසින් අනාවරණය කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ප්‍රශස්ත මූල්‍ය

කළමනාකරණයක් පවත්වා ගැනීම සඳහා COPA වාර්තා මඟින් හඳුනාගනු ලබන කරුණු නිවැරදි කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.

COPA වාර්තාව ලැබීමෙන් පසු, එමඟින් අවධාරණය කෙරෙන පොදු ගැටළු වලට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අත්සනින් භාණ්ඩාගාර සටහන් නිකුත් කරනු ලැබේ. මෙම භාණ්ඩාගාර සටහන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි, ගණන් දීමේ නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් විසින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ මාර්ගෝපදේශ යොමු ලෙස භාවිතා කෙරේ.

භාණ්ඩාගාර නියෝජිතයන් මෙම වසර පුරාවටම මෙම කමිටු රැස්වීම් සඳහා සහභාගී වෙමින් මාර්ගෝපදේශනය ලබාදුන් අතර කමිටු වාර්තා සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, COPA වාර්තා මඟින් අවධාරණය කළ කරුණු සම්බන්ධයෙන් ඉතා වැදගත් වන නිරීක්ෂණ, නිගමන හා නිර්දේශ ලබාදීමට 2019 වසරේදී උපදෙස් ලබා දී ඇත.

1.3 රාජ්‍ය ආයතන වලට අදාළ විගණන විමසුම් හා විගණන වාර්තා සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග

විගණකාධිපතිවරයා විසින් විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධව ඉදිරිපත් කරන ලද විගණන වාර්තා පිළිබඳව අවධානය යොමු කර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, හා ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.

තවදුරටත්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තිය යටතේ රාජ්‍ය සංස්ථා හා රජයට පවරාගත් ආයතන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් යෝජනා කරන ලද විගණන ගාස්තු සඳහා එකඟත්වය ලබාදීම ද සිදුකර ඇත.

1.4 රජයේ ගාස්තු හා අයකිරීම්

සේවා සම්පාදනයේදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අය කරනු ලබන ගාස්තු ඒ සඳහා දරනු ලබන පරිපාලන වියදම් හා එසේ සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය අනුව, සේවා සම්පාදනය හා සේවාලාභියා යන දෙපාර්ශයටම සාධාරණ ගාස්තුවක් විය යුතුය. මෙම ගාස්තු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් කලින් කලට සමාලෝචනය කරනු ලැබේ.

ඒ අනුව, 2018 වසරේදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් මඟින් අයකරන ගාස්තු මෙම දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අයකරනු ලබන ගාස්තු සංශෝධනය කරන ලදී.

*වගුව අංක **01** - රජයේ ගාස්තු හා අයකිරීම්*

	අමාත්‍යාංශයේ නම		සංශෝධිත ගාස්තු
01	කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කරවීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	(අ)	වෙළඳ ලකුණු
		(ආ)	පේටන්ට් බලපත්‍ර
		(ඇ)	කාර්මික සැලසුම්
		(ඈ)	නියෝජිතයින්
		(ඉ)	විස්තර පාඨ
		(ඊ)	වෙළඳ ලකුණු
02	ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය	(අ)	අයවැය යෝජනා - 2018 ක්‍රියාත්මක කිරීම රජයේ නියෝජිතායතන මගින් සපයනු ලබන සේවා සඳහා අයකරන ගාස්තු (2018.07.06) • දුම්රිය ගාස්තු සංශෝධනය
		(ආ)	මෝටර් රථ ප්‍රවාහන පනතට අනුව ගාස්තු සංශෝධනය (28.09.2018)
03.	තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශය		මිරිස්සේ තල්මසුන් නැරඹීමේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම - එක් විදේශිකයෙක් සඳහා සේවා ගාස්තුව ඇ.ඩො. 01 හා එක් දේශීය සංචාරකයෙක් සඳහා රු. 50.00ක් වන පරිදි
04.	අධිකරණ අමාත්‍යාංශය	(අ)	භාරකාර ගාස්තු
		(ආ)	දෙපාර්තමේන්තු
		(ඇ)	සේවා ගාස්තු
05.	ආරක්ෂක අමාත්‍යාංශය	(අ)	ගුවන් යානා ශේෂ ආදායම
		(ආ)	කෞතුකාගාර ප්‍රවේශ පත්‍ර
06.	නීතිය හා සාමය	(අ)	විදේශ ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලට අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම.
		ආ)	විදේශ රටක සිට තැපැලෙන් අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම
07.	විදේශ කටයුතු		විදේශයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල මෙහෙයුම් වලදී e-DAS පද්ධතිය ක්‍රියාත්මක කිරීම - 2018.05.01
08	ස්වදේශ කටයුතු		විද්‍යුත් ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ලියාපදිංචි කිරීම.
09.	ආරක්ෂක	(අ)	පුද්ගලයන් 25 දෙනෙකු විසින් එක් දිනකදී වෙඩි බෙහෙත් භාවිතා කිරිම වෙනුවෙන් රජයේ ගාස්තු ලෙස රු. 12,500.00 අය කිරීම.
		(ආ)	ඊට අමතර සෑම පුද්ගලයෙකු සඳහා රු. 500.00 ක රජයේ ගාස්තුවක් අය කිරීම.
10.	මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛනිජ		තෙල් වෙළඳාම සඳහා වාර්ෂික බලපත්‍ර

	තෙල් සම්පත් සංවර්ධන		ගාස්තුව ඩොලර් 1000 සිට 5000 දක්වා ඉහළ දැමීම.
11.	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ		සංචාරක බංගලා
12	අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු	(අ)	පුස්තකාල ස්ථිර/ තාවකාලික
		(ආ)	සාමාජිකත්ව ඡායාරූප (මෘදු පිටපත්)
13	පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා	(අ)	සංචාරක බංගලා වෙන් කිරීම
		(ආ)	ශ්‍රවණාගාරය වෙන් කිරීම
		(ඇ)	ප්‍රවාහන යෝග්‍යතා සහතික පොත් කට්ටල සඳහා

1.5 පාඩු හා කපා හැරීම්

2018 වර්ෂයේ පාඩු හා කපාහැරීම් පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.
මුදල් රෙගුලාසි (මු.රෙ.)102 සිට 110 යටතේ දැක්වෙන රජයේ දේපළ හා රජය භාරයේ තිබෙන මූල්‍ය වටිනාකමක් ඇති දේපළ සම්බන්ධයෙන් නිලධාරීන්ට පාලනය කල නොහැකි හේතූන් මත සිදුවී ඇති අලාභ හානි හැර රජයේ නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදයන් නිසා සිදුවන අනෙකුත් අලාභ හානි හා අක්‍රමිකතා රජයට සිදුවන අලාභ හානි ලෙස සලකා අයකර ගැනීමට කටයුතු කරයි.

ඉහත පරිදි යම් රක්ෂණාවරණයකින් හෝ වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකරගත නොහැකි අලාභ සහ හානි හා රජයට අයවිය යුතු ව්‍යවස්ථාපිත හා වෙනත් ආදායම් ද අත්තිකාරම් ගිණුම් යටතේ අයවිය යුතු මුදල් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම දරා අයකර ගැනීමට වෙනත් විකල්ප නොමැති අවස්ථාවලදී මු.රෙ. 108 යටතේ කපාහැරීමට හා මු.රෙ. 113 යටතේ අත්හැරීමට කටයුතු කරනු ලැබේ.

වගු අංක 02- පාඩු හා කපා හැරීම්

විස්තරය	අමාත්‍යාංශය	අගය (රු.)
මුදල් රෙගුලාසි 108(3) ප්‍රකාරව, 35/8 සිට 35/13 දක්වා අග්‍රිම ගිණුම්වල නොපියවූ අග්‍රිම ශේෂය පියවීම	විදේශ කටයුතු	49,525,429.05
ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය (NEMO) විසින් කුලියට ගනු ලැබූ යන්ත්‍රෝපකරණ සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA/ ICTAD) වෙත අයවිය යුතු හිඟ මුදල එම පොත් වලින් අතහැර දැමීම.	නිවාස හා ඉදිකිරීම්	114,529,393.00
වාහන රක්ෂණාවරණයක් නොමැති අංක PD – 9102 දරණ වාහනය අනතුරට ලක්වීම හේතුවෙන් සිදුවූ හානියේ ඉතිරිය කපා හැරීම.	නිවාස හා සමාජ සුභසාධනය	420,282.68
රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් “බී” ගිණුම් ශේෂය කපා හැරීම.	රාජ්‍ය සේවා කොමිසම	27,900.00

රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් "බී, ගිණුමේ ශේෂය කපා හැරීම	මහවැලි සංවර්ධන හා පරසර - වනජීවි දෙපාර්තමේන්තුව	104,356.00
කොළඹ ප්‍රධාන මුලස්ථානයේ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අස්ථානගත වු මුද්දර සම්බන්ධයෙන් ඇතිවූ පාඩුව	තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු	4,146,650.00
වාහන රක්ෂණාවරණයක් නොමැති WP GI – 8444 ජීප් රථය අනතුරට ලක් වීමෙන් සිදු වූ පාඩුවේ ඉතිරිය කපා හැරීම.	ආරක්ෂක	2,844,919.19
KF ණය අංක 711 යටතේ පවතින ප්‍රතිපූර්ණය නොකළ මුදල	අධ්‍යාපන හා උසස් අධ්‍යාපන	211,392,244.70
මුදල් රෙගුලාසි 113 අනුව රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - එච්. එම්. ඩී. බණ්ඩාර මහතා (ජල මාපක නිලධාරි)	වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ	10,034.00
මුදල් රෙගුලාසි 113 අනුව රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - R. රාජේශ්වරන් මයා (වැඩ පරිපාලක)	කෘෂිකර්මාන්ත, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව	21,035.00
මුදල් රෙගුලාසි 113 අනුව රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - M.R. රණවීර මයා (තාක්ෂණික සහකාර)	කෘෂිකර්මාන්ත,ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව	73,182.00
මුදල් රෙගුලාසි 113 අනුව රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - M.R. රණවීර මයා (තාක්ෂණික සහකාර)	අධ්‍යාපන - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව	20,580.00
ශ්‍රී ලංකා කෘෂිකාර්මික විකුණුම් අධිකාරියේ (පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) පාඩු කපා හැරීම. 2018.01.10	ස්වදේශ කටයුතු	4,948,542.72
CWE (පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) පාඩු කපා හැරීම.	ස්වදේශ කටයුතු	10,011,086.00
රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුම කුලි හා ගාස්තු	රාජ්‍ය මුදල් හා ජනමාධ්‍ය	46,553.00
1982 - 2012 කාල සීමාව තුළ රේගු අතිකාල දීමනා අරමුදලේ අසංතුලිත ණය ගැතියන් කපා හැරීම.	රාජ්‍ය මුදල් හා ජනමාධ්‍ය	23,752,879.72
රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුම යටතේ ණය ගැති ශේෂය කපා හැරීම - අංක 10401 – U.K. රත්නසිංහ	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු	295,021.00
පරණ නොගෙවූ ණය ශේෂ කපා හැරීම. රු. 10,000.00 ට ඉහළ ණය ශේෂ	ආරක්ෂක	757,215.00
මුදල් රෙගුලාසි 113 යටතේ රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - M. කාලි අම්මා මිය	මෙගාපොලිස් හා බස්නාහිර	10,600.00
මුදල් රෙගුලාසි 113 යටතේ රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ	මෙගාපොලිස් හා බස්නාහිර	44,808.00

ශේෂය කපා හැරීම - M. H. K. අමරසිංහ		
මුදල් රෙගුලාසි 113 යටතේ රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් B ගිණුමේ ශේෂය කපා හැරීම - V. කුප්පම්මා මිය	මෙගාපොලිස් හා බස්නාහිර	15,525.00
එකතුව		422,998,236.06

1.6 රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය

අංක 2/92 දරණ රාජ්‍ය දූත මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ලංකාවේ සිටින විදේශීය රාජ්‍ය නියෝජිත ආයතනයන්හි නිලධාරීන් සිය රාජකාරී කටයුතු සඳහා මෙරටට ආනයනය කරනු ලබන වාහන ඔවුන් නැවත සිය මව්බිම බලා යාමේදී දේශීය වෙළඳපළ තුල විකුණනු ලබයි. එහිදී රජයට ගෙවිය යුතු තීරුබදු මුදල පිළිබඳ කටයුතු කිරිමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

ඒ අනුව, රේගු දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී විදේශ දූත මණ්ඩල 58 ක් විසින් අපහරණය කරන ලද වාහන ආදායම වශයෙන් රු. 77,197,998/- ක මුදලක් රජයේ ආදායමට බැර කොට තිබේ.

1.7 2018 වසර තුලදී මුදල් රෙගුලාසි අංක 494 යටතේ මුද්දර ගාස්තු ලෙස අයකර ගන්නා ලද ආදායම් වෙන්කිරීම

2018 වසරේ මුද්දර ආදායමෙන් විවිධ ආයතන වෙත අරමුදල් වෙන් කළ අතර, “භාණ්ඩාගාර 68” මාරු කිරීම් පත්‍ර හරහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී.

වගු අංක 03 - මුද්දර ගාස්තු

ආයතනය	ආදායම් ශීර්ෂය	බැළු (රු.)	හර (රු.)
මුද්දර ආදායම (පොදු)	5000/10 02 07 00	3,266,659,632.91	
තැපැල් දෙපාර්තමේන්තුව	4000/20 01 02 00		2,344,644,065.00
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	6000/00/14/0/3		906,204,459.91
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	4000/20 03 02 03		6,891,081.00
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	4000/10 03 07 02		8,049,327.00
මිණුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව	6000/0/0/6/69		580,467.00
-එම-	4000/20 03 02 99		290,233.00
		3,266,659,632.91	**3,266,659,632.91**

1.8 ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් පත් කිරීම 2018

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(1) වගන්තියෙන් බලය පවරා ඇති අන්දමට, අමාත්‍යාංශ ලේකම්වරුන් ස්වකීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස කටයුතු කළ යුතුය. ඒ අනුව, මෙම කාලසීමාව තුළ ලේකම්වරු 18 දෙනෙක් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස පත් කරමින් ලිපි නිකුත් කිරීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරන ලදී.

2 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2018

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේදී රාජ්‍ය ප්‍රසම්පාදනය, මුදල් රෙගුලාසි හා අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් චක්‍රලේඛ හා අතිරේක නිකුත් කරන ලදී.

වගු අංක 04 - රාජ්‍ය මුදල් චක්‍රලේඛ

	දිනය	චක්‍රලේඛ අංකය	මාතෘකාව
1.	17-01-2018	01/2018	2018 අයවැයේ 261 වන යෝජනාව පරිදි ගාස්තු හා අයකිරීම් ප්‍රතිශෝධනය සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2018 නිකුත් කිරීම.
2.	27-08-2018	02/2018	ව්‍යවස්ථාපිත හා වයවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කිරීම - අයවැය යෝජනා 2016
3.	23-10-2018	05/2018	ශ්‍රී ලංකා රාජ්‍ය සේවයට විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-Gp) පද්ධතියක් හඳුන්වා දීම.
4.	16-11-2018	රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය අංක 05	ශ්‍රී ලංකා රාජ්‍ය සේවයට විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-Gp) පද්ධතියක් හඳුන්වා දීම.
5.	19-11-2018	06/2018	රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන සඳහා දේශීය ණයවර ලිපි විවෘත කිරීම.
6.	26-11-2018	07/2018	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SCAPCs)/ අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු (CAPCs)/ අමාත්‍ය මණ්ඩලය පත්කළ සාකච්ඡා සම්මුති කමිටු (CANCs)/ අමාත්‍ය මණ්ඩලය පත් කළ උපදේශකත්ව ප්‍රසම්පාදන කමිටු (CACPCs)

2.1 2018 අයවැය යෝජනාවලියේ අංක 261 යෝජනාව අනුව ගාස්තු හා අයකිරීම් ප්‍රතිශෝධනය සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2018 නිකුත් කිරීම.

රජයේ නියෝජිතායතන විසින් සපයනු ලබන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු වසර ගණනකින් සංශෝධනය කර නොමැති බව අනාවරණය විය. එබැවින්, 2018 වසරේ අයවැය යෝජනා අනුව මෙම ගාස්තු වර්තමාන ආර්ථික දර්ශක පිළිඹිඹු වන ආකාරයෙන් කලින් කලට සංශෝධනය කළ යුතු බව පාර්ලිමේන්තුවේ මතය විය. ඒ අනුව, පසුගිය වසර 3 පුරාවට සංශෝධනය කොට නොතිබූ එවැනි ගාස්තු වර්ග 09 ක් අවම වශයෙන් 15% කින් හෝ ඉහළ දැමීමට යෝජනා වූ අතර, ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගන්නා ලදී.

ඉන් අනතුරුව, වර්තමාන ආර්ථික අවශ්‍යතාව සපුරාලීම සඳහා ගාස්තු හා අයකිරීම් සංශෝධනය කරනු වස් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කරමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2018.01.17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2018 නිකුත් කරන ලදි.

2.2 2018.08.27 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරීම.

රජයේ පාලනයේ පවතින සියළුම අරමුදල්වල පැවැත්ම සාධාරණය කිරීමේ හා එවැනි අරමුදල් පිළිගත් පාර්ලිමේන්තු ක්‍රමවේදයක් යටතේ පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනයට යටත් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2.3 2018.10.23 දිනැති අංක 05/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරීම

(ශ්‍රී ලංකා රාජ්‍ය අංශයට විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (**e-GP**) පද්ධතියක් හඳුන්වා දීම.)

රාජ්‍ය අංශය තුළ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියක් (e-GP) හඳුන්වා දීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු ආරම්භ කොට තිබේ. මෙම නව පද්ධතිය හඳුන්වා දෙමින් එය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන වෙතින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටිමින් යථෝක්ත චක්‍රලේඛය නිකුත් කරන ලදී.

I. සම්බන්ධීකරණ නිලධාරියෙකු නම් කිරිම
II. ගතවූ වසර 3 තුළ සිදු කරන ලද ප්‍රසම්පාදන ගණුදෙනු
III. 2019 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්ම

2.4 2018.11.19 දිනැති අංක 06/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය

රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා දේශීය ණයවර ලිපි විවෘත කිරීම

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී ගෙවීම් කොන්දේසියක් ලෙස දේශීය ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රවණතාවක් පවතින බව නිරීක්ෂණය කොට තිබේ. මෙම තත්ත්වය දිගටම පැවතීමෙන් රජයේ මූල්‍ය ප්‍රවාහය හා රාජ්‍ය මූල්‍ය කළමණාකරණය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වේ. එබැවින් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී මිල ගනන් ඉදිරිපත් කිරීමේ ලිපි ලේඛන වල " දේශීය ණයවර ලිපි විවෘත කිරිම මඟින් ගෙවිම් සිදු කිරිම" ලෙස ගෙවීම් කොන්දේසියක් ඇතුළත් කරන්නේ නම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟතාව ලබා ගත යුතු බව මෙකී චක්‍රලේඛය මඟින් අවධාරණය කෙරේ.

2.5 2018.11.26 දිනැති අංක 07/2018 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය

අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු (CAPCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා සම්මුති කමිටු (CANCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ උපදේශක ප්‍රසම්පාදන කමිටු (CACPCs)

අමාත්‍යාංශ කාර්යභාරය වෙනස් වන අවස්ථාවන්හිදී, ඒ වන විටත් ක්‍රියාත්මකව පැවති ප්‍රසම්පාදනයන් සැලසුම් කොට තිබූ පරිදි සම්පූර්ණ කර ගැනීම සඳහා 2018 වසරේ අග භාගයේදී විධිමත් ක්‍රමවේදයක් සකස් කරගත් බව.

3 ප්‍රසම්පාදන කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 19 වැනි සංශෝධනය ප්‍රකාරව රජයේ ආයතන සඳහා භාණ්ඩල වැඩ, සේවා, උපදේශකත්ව සේවා සහ තොරතුරු පද්ධති සඳහා යුක්ති සහගත, සාධාරණ, විනිවිදභාවයෙන් යුතු මෙන්ම පිරිවැය සඵලදායී ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් කටයුතු සම්පාදනය කිරීමේ බලතල ජාතික ප්‍රසම්පාදන කොමිසම වෙත පැවරී ඇත.

කෙසේ වුවත්, 2018 වර්ෂයේ අවසන් භාගය තෙක්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත පවරා ඇති ඇතැම් කාර්යයන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ඒ අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ එකඟතාව සහිතව රාජ්‍ය ප්‍රසම්පාදනය හා සම්බන්ධ චක්‍රලේඛ සහ අතිරේක නිකුත් කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරමින් පවතී.

වෙළඳපොළ උත්තේජනය කරමින් දේශීය ආයතන දිරිමත් කිරීම සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්තීන් පුළුල් කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හරහා වෙළඳපොළ වර්ධනය කරමින් අවාසිදායක අංශ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා දීර්ඝකාලීණ වශයෙන් සහායලබාදීම මඟින් ආර්ථික උත්පාදනයට දායක වන්නාවූ දිරිගැන්වීමට කටයුතු කරනු ලබයි.

විනිවිදභාවය, සාධාරණත්වය වැනි ප්‍රතිපත්තීන් හා සමගාමීව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කළ යුතුය. ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත මාර්ගෝපදේශ අනුව නියාමනය කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත - 2006 (භාණ්ඩ හා වැඩ)

(ආ) උපදේශන සේවා ලබා ගැනීම - 2007

(ඇ) රජයේ ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ (PPP Projects)සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු 1998 – II කොටස

3.1 2018 වර්ෂයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තීන් සඳහා කරන ලද සංශෝධන

I. 2018.10.23 දිනැති අංක 05/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරීම (විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e - GP) පද්ධතියක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයට හඳුන්වා දීම.)

II. 2.5 2018.11.26 දිනැති අංක 07/2018 දරන චක්‍රලේඛය නිකුත් කිරීම.

අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු (CAPCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා සම්මුති කමිටු (CANCs)

අමාත්‍ය මණ්ඩලය පත් කළ උපදේශක ප්‍රසම්පාදන කමිටු (CACPCs)

වගු අංක 05 - අමාත්‍ය මණ්ඩල මට්ටමේ ප්‍රසම්පාදන කමිටු ගණන - 2018

අමාත්‍යාංශයේ නම	CAPC/ CANC	CANC	PC	CACPC	TEC	SCAPC	SCANC	විශේෂ	මුළු ගණන
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති පත්වීම් සංඛ්‍යාව	59	68	45	25	173	16	01	14	401

III ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2006 සඳහා 2018.07.09 දිනැතිව 34 වන අතිරේකය

මෙම අතිරේකය කොන්ත්‍රාත් ප්‍රදානය, විවෘත තරඟකාරී ලංසු පටිපාටිය යටතේ නිර්දේශ කිරීම්, කොන්ත්‍රාත් ප්‍රදානය/ පටිපාටිය යටතේ නිර්දේශ කිරීම්, වෙළඳපොළ මිළ සැඳැහුම් ක්‍රම, හෝ භාණ්ඩ නැවත ඇණවුම් කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාව සඳහන් කරමින් මෙම අතිරේකය නිකුත් කරන ලද අතර මෙමගින් 33 අතිරේකය ඉවත් කර 34 වන අතිරේකය ප්‍රතියෝජනය කරනු ලැබේ.

3.2 විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය (e - GP)

ශ්‍රී ලංකාවේ වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුව වන “දැක්ම 2025” යටතේ තාක්ෂණය සහ ඩිජිටල්කරණය යනු අවධානය යොමු කළ යුතු එක් ප්‍රධාන අංශයකි .මෙම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය මෙහෙයුම ඩිජිටල්කරණය කිරීම වැඩිදියුණු කිරීම මේ ක්ෂේත්‍රය යටතේ එන එක් කර්තව්‍යයකි. මේ අනුව, විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියක් හඳුන්වාදීම වැදගත්, අත්‍යවශ්‍ය හා හිතකර කරුණකි. ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යටතේ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයක් ස්ථාපනය කොට තිබේ.

“දකුණු ආසියාවේ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය (e-Gp) ”යන තේමාව රැගත් දකුණු ආසියා කළාපයේ රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය සිව් වැනි වරටත් 2017 පෙබරවාරි මස 20 සිට 27 දක්වා ශ්‍රී ලංකාවේ දී (කොළඹ සහ නුවර) පැවැත්වුණු අතර මෙයට සමගාමී ව, ශ්‍රී ලංකාවේ, රජයේ ප්‍රසම්පාදන පද්ධතිය වෙත විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීමේ මූලික සංකල්පය හඳුන්වා දෙමින්, “ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදනය හඳුන්වාදීම” යන මැයෙන්, 2017.06.19 දිනැති අංක 17/12 73/719/087 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2017.06.27 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දෙන ලදී.

මේ අනුව කොළඹ විශ්ව විද්‍යාලය, එහි ‘School of Computing (UCSC)’ වැනි පුළුල් පරාසයක පාර්ශවකරුවන් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සඳහා රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-Gp) හඳුන්වාදීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කරන ලද අතර

2017.12.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මෙකී ක්‍රියාකාරී කණ්ඩායමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

මේ අනුව, රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කොට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යටතේ රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයක් ස්ථාපනය කිරීමට නියමිතය.

වර්තමානයේ රාජ්‍ය ආයතන වෙනුවෙන් තොරතුරු තාක්ෂණ විසඳුම් සපයන කොළඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ හස්තය වන "තීක්ෂණ" ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-Gp) ක්‍රියාකාරී කණ්ඩායමේ නිර්දේශය සහ පසු කාලීන ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව කටයුතු කරනු ඇත.

හිඟ සම්පත් උපයෝජනය කරමින් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයේ ආර්ථිකය, කාර්යක්ෂමතාව, විනිවිදභාව හා වගකීම් සහගත බව වැඩි දියුණු කරමින් හිඟ සම්පත් උපයෝජනය සඳහා උපකාරී වන්නා වූ රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සඳහා මෙම විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-Gp) පද්ධතිය විශාල ලෙස උපකාරී වනු ඇත. එසේම මෙමඟින්, ප්‍රසම්පාදන චක්‍ර කාලය අවම කරමින් එහි වේගය, නිරවද්‍යතාව, කාර්යක්ෂමතාව සහ රහස්‍යභාවය සුරකිමින් අයථා ක්‍රියාදාමයන් සහ දූෂ්‍ය ක්‍රියා සඳහා ඇති අවකාශය අවම කරමින් සැලකිය යුතු ඉතිරියක් උත්පාදනය කිරීමට හැකි වේ.

4 අරමුදල් කළමනාකරණය

විවිධ රාජ්‍ය ආයතන මඟින් පවත්වා ගෙන යනු ලබන සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පිළිගත් ක්‍රමවේදයක් යටතේ පාර්ලිමේන්තුවේ පාලනය යටතට ගෙන ඒමේ අරමුණින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2016 ප්‍රකාරව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය සඳහා මෙන්ම වර්තමාන අවශ්‍යතා පිළිඹිබු වන අන්දමින් එම අරමුදල්වල විෂය පථය, බලාධිකාරය හා අරමුණු වලට සිදු කළ යුතු වෙනස්කම් ඇතුළත් කරමින් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කොට තිබේ.

මෙම කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇති අතර එහි නියෝග මත පදනම් වෙමින් පහත සඳහන් නිර්දේශ සහිතව 2018.08.27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2018 (ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය - 2016 අයවැය යෝජනා) නිකුත් කරන ලදී.

I. සමාලෝචිත සමස්ත අරමුදල් 210 අතරින්, 105 ක් මහජන අරමුදල් ලෙස හඳුනා ගෙන ඇති අතර ඉන් අරමුදල් 10 ක් මහජන මතය කෙරෙහි විශාල බලපෑමක් එල්ල කරනු ලබන අතර වැඩිදුර අධ්‍යනයක් සිදු කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

II. දැනට පවත්වාගෙන යනු ලබන අන්දමින් අරමුදල් 21 ක් අරමුදල් ආදායම් භාවිතා කරමින් ඉදිරියටත් පවත්වාගෙන යෑම.

III. වසා දැමිය හැකි බවට හඳුනාගෙන ඇති අරමුදල් වසා දැමීමට කටයුතු කිරීම.

IV. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති 148 හා 149 අනුව, අනෙකුත් සියලුම අරමුදල් පාර්ලිමේන්තුවේ පාලනය යටතට ගැනීම.

මෙකී නිර්දේශ අන්තර්ගත කරමින් භාණ්ඩාගාර චක්‍රලේඛයක් නිකුත් කිරීමට උපදෙස් දී ඇති අතර පහත සඳහන් අරමුදල් 13 වසා දැමීමට ඒකාබද්ධ අනුමැතිය ලබා දී තිබේ.

වගු අංක 06 - වසා දැමීමට තීරණය කොට ඇති අරමුදල් ලැයිස්තුව

	අරමුදලේ නම	රාජ්‍ය ආයතන
01	ජාතික උද්භිත උද්‍යාන භාරකාර අරමුදල	ජාතික උද්භිත උද්‍යාන දෙපාර් තමේන්තුව
02	අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරකාර අරමුදල	අධිකරණ සේවා කොමිෂන් සභාව
03	මාර්ග නඩත්තු භාරකාර අරමුදල	තිරසාර සංවර්ධනය සහ වනජීවී අමාත්‍යාංශය
04	ජාතික ළමා සංවර්ධන අරමුදල	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
05	වනජීවී භාරකාර අරමුදල	තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය
06	වාහන වායු විමෝචන භාරකාර අරමුදල	මෝටර් රථ ප්‍රවාහන දෙපාර් තමේන්තුව
07	සිසු අරුණ ශිෂ්‍යත්ව අරමුදල	අධ්‍යාපන අමාත්‍යාංශය
08	මහින්දෝදය ශිෂ්‍යත්ව අරමුදල	අධ්‍යාපන අමාත්‍යාංශය
09	සුජාත දියණී අරමුදල	අධ්‍යාපන අමාත්‍යාංශය
10	නාවික සංවර්ධන අරමුදල	වරාය, නැපැල් හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
11	රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
12	වතු අංශයේ ස්වයං රැකියා වන්‍ශ්‍ය අරමුදල	කඳුරට, නව ගම්මාන යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
13	විශේෂ ආර්ථික මධ්‍යස්ථාන නඩත්තු අරමුදල	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය

5 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම

මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ වලින් 50% කට ආසන්න ප්‍රමාණයක් සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් නිරීක්ෂණ ලබාදීම හෝ වෙනත් දෙපාර්තමේන්තු මඟින් නිරීක්ෂණ සැපයීමේදී ඒ පිළිබඳව මෙම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ ලබා දීම සිදු කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුවට එහි කාලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වැය කිරීමට සිදුවේ.

ඒ අනුව 2018 වසර තුළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ 865 ක් හා උපදේශන 223 ක් සපයා තිබේ.

වගු අංක 07 - අංශයන් අනුව අමාත්‍ය මණ්ඩල නිර්දේශ ලැයිස්තුව

අංකය	අංශය	උපදේශන සංඛ්‍යාව	නිරීක්ෂණ සංඛ්‍යාව
01	ප්‍රාදේශීය සංවර්ධනය	04	-
02	පාලනය	48	111
03	පරිසරය	10	34
04	ආරක්ෂාව	12	29
05	ආගමික හා සංස්කෘතික කටයුතු	05	12
06	ප්‍රාථමික කර්මාන්ත	06	47
07	සමාජ සුභසාධනය	17	15
08	තරුණ කටයුතු	08	-
09	විදේශ රැකියා	07	-
10	යටිතල පහසුකම්	51	399
11	සෞඛ්‍ය	08	54
12	කර්මාන්ත	17	84
13	විශේෂ වියදම් ඒකකය	10	23
14	ඉඩම්	01	06
15	අධ්‍යාපනය	19	51
	එකතුව	223	865

සටහන් 01- 2018 වර්ෂයේ විවිධ ආර්ථික අංශයන් අනුව නිරීක්ෂණ



6 පාලන හා මූල්‍ය අංශය

6.1 කාර්යමණ්ඩල

පහත සඳහන් නිලධාරීන්ගෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමන්විත වේ.

වගු අංක 08 - 2018.12.31 දිනට කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2018.12.31 දිනට සත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	03	01	02
අධ්‍යක්ෂ	12	11	01
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ	12	07	05
පරිපාලන නිලධාරි	01	01	-
භාෂා පරිවර්තක	01	01	-
සංවර්ධන නිලධාරි මූල්‍ය සහකාර සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර	16	15	01
කළමනාකරණ සහකාර	14	14	-
රියදුරු	07	07	-
කාර්යාල කාර්ය සහායක	08	07	01
එකතුව	75	65	10

6.2 2018 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

වගු අංක 09 - 2018 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

අනු අංකය	නම	තනතුර
01.	එස්. යූ. චන්ද්‍රකුමාරන් මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
02.	ජේ. එම්. යූ. පී. ජයමහ මයා	අධ්‍යක්ෂ
03.	ටී. ප්‍රශාන්ත් මිය	අධ්‍යක්ෂ
04.	ඩී. එම්. එස්. එන්. ටී. ජයසේකර මෙය	සහකාර අධ්‍යක්ෂ
05.	සී. ඩී. ලියනගේ මිය	සහකාර අධ්‍යක්ෂ
06.	එස්. වී. වෙත්තසිංහ මිය	සහකාර අධ්‍යක්ෂ
07.	පී. සී. විමලසූරිය මයා	සංවර්ධන නිලධාරි
08.	ජී. ඩී. සී. ශාන්තිදේව මිය	කළමනාකරණ සහකාර
09.	ඩී. ඩී. ඒ. එස්. ජයරත්න මිය	කළමනාකරණ සහකාර
10.	ඩී. එස්. ඩබ්. සේරම් මයා	කළමනාකරණ සහකාර
11.	එම්. එස්. ගාමිණී මයා	රියදුරු
12.	ටී. එම්. සී එස්. තෙන්නකෝන්	රියදුරු
13.	ඩී. ආර්. එස්. ප්‍රියන්ත මයා	රියදුරු
14.	වයි. එල්. එම්. යූ. පී. යකන්දාවල මයා	රියදුරු
15.	කේ. එම්. ඕ. ආර්. කුලසේකර මයා	කාර්යාල සහායක
16.	කේ. ඒ. එස්. කුමාර මයා	කාර්යාල සහායක
17.	ඩබ්. පී.පී.කේ විජේසිංහ මයා	කාර්යාල සහායක
18.	සී. එස්. අබේවික්‍රම	කාර්යාල සහායක

6.3 2018 වර්ෂයේ ස්ථාන මාරුවීම් ලැබ පිටතට ගිය නිලධාරීන්

වගු අංක 10 - 2018 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

අනු අංකය	නම	තනතුර
01.	කේ. ඩී. ආර්. ඔල්ගා මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
02.	ඩබ්. ජී. චන්ද්‍රිකා මිය	අධ්‍යක්ෂ
03.	ඩී. කේ. ටී. සමන්මලී	නියෝජ්‍ය අධ්‍යක්ෂ
04.	එච්. ඒ. ටී. එරන්දි මිය	සහකාර අධ්‍යක්ෂ
05.	ආර්. කේ. එස්. එන්. රණසිංහ මිය	සංවර්ධන නිලධාරි
06.	එන්. එස් කේ. ආරච්චි මිය	සංවර්ධන නිලධාරි
07.	ඒ. විරසිංහ මයා	සංවර්ධන නිලධාරි
08.	එච්. ඒ. එස්. දර්ශන මයා	කළමනාකරණ සහකාර
09.	ඒ. ආර්. ඒ. එස්. බී. ආතාවුද මයා	කළමනාකරණ සහකාර
10.	එම්. ඒ. ආර්. ප්‍රියන්ති මිය	කළමනාකරණ සහකාර
11.	ජී. සුරංජ මයා	රියදුරු
12.	ආර්. ඒ. ජේ. සම්පත් මයා	රියදුරු
13.	එම්. ඒ. එච්. අයි. හසන් මයා	රියදුරු
14.	ඩී. ආර්. එස්. ප්‍රියන්ත මයා	රියදුරු
15.	කේ. ඒ. එස්. සී. කුලතුංග මයා	කාර්යාල සහායක
16.	ඩී. අමරසිංහ මයා	කාර්යාල සහායක

6.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

6.4.1 විදේශ පුහුණුවීම්

වගු අංක 11 - 2018 වර්ෂයේ විදේශ පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන්

අනු අංකය	නිලධාරියාගේ නම	නිලධාරියාගේ තනතුර	පුහුණුවේ නම	ආයතනය	රට
01.	පී. අල්ගම මහතා	අධ්‍යක්ෂ ජනරාල්	❖ 05 වන දකුණු ආසියා කලාපීය රාජ්‍ය ප්‍රසම්පාදන සමුළුව	පිරිවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ඉන්දියාව	ඉන්දියාව
			❖ 2018 රාජ්‍ය අතර අන්තර්ජාතික ප්‍රසම්පාදන වැඩමුළුව සහ විද්‍යුත් ප්‍රසම්පාදනය	කොරියානු රාජ්‍ය ප්‍රසම්පාදන සේවය	කොරියාව
			❖ අධ්‍යන චාරිකාව (විද්‍යුත් ප්‍රසම්පාදනය)	ලෝක වෙළඳ සංවිධානය	ජෝර්ජියාව
			❖ ගෝලීය රාජ්‍ය ප්‍රසම්පාදන වැඩමුළුව		
02.	කේ. ඩී. ආර්. ඔල්ගා මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	❖ අධ්‍යන චාරිකාව (විද්‍යුත් ප්‍රසම්පාදනය)	-	ජෝර්ජියාව

03.	ජේ. සී. වැලිගමගේ මිය	අධ්‍යක්ෂ	❖ තිරසාර විද්‍යුත් රාජ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීම	FMEP	සිංගප්පූරුව
			❖ අයිපීඑස්ජ්එස්බී ක්‍රමෝපාය වටය හා ධාරිතාව ගොඩනැඟීමේ සංසදය	-	පිලිපීනය
			❖ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	SLIDA	ඉන්දියාව
04	ජේ. එම්. යූ. පී. ජයමහ මයා	අධ්‍යක්ෂ	❖ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	SLIDA	ඉන්දියාව
			❖ ශ්‍රී ලංකාවේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව භාවිතය හා සංවර්ධනය	-	චීනය
05.	ඊ. ඒ. රත්නසීල මයා	අධ්‍යක්ෂ	❖ 05 වන දකුණු ආසියා කලාපීය රාජ්‍ය ප්‍රසම්පාදන සමුළුව	පිරිවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ඉන්දියාව	ඉන්දියාව
			❖ මැදි ආදායම් රටවල තිරසාර සංවර්ධනය	ආසියානු පදනම	කොරියාව
06.	ඩබ්. ජී. චන්ද්‍රිකා මිය	අධ්‍යක්ෂ	❖ තිරසාර විද්‍යුත් රාජ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීම	FMEP	සිංගප්පූරුව
07.	ආර්. එම්. ජයන්ති මිය	අධ්‍යක්ෂ	❖ ශ්‍රී ලංකාවේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව භාවිතය හා සංවර්ධනය	-	චීනය
08.	ජී. ඒ. ඒ. ප්‍රියන්ත මයා	අධ්‍යක්ෂ	❖ 2018 රාජ්‍ය අතර අන්තර්ජාතික ප්‍රසම්පාදන වැඩමුළුව සහ විද්‍යුත් ප්‍රසම්පාදනය	කොරියානු රාජ්‍ය ප්‍රසම්පාදන සේවය	කොරියාව
			❖ ආර්ථික සංවර්ධනය	සිංගප්පූරු සහයෝගීතා වැඩසටහන	කටාර්
09.	ඩී. එන්. එස්. වැලිකල මිය	අධ්‍යක්ෂ	❖ ආසියානු රටවල වෙළඳ ප්‍රවර්ධනය	-	චීනය
10.	ටී. ප්‍රශාන්ත් මිය	අධ්‍යක්ෂ	❖ අධ්‍යන චාරිකාව	SLIDA	මැලේසියාව

11.	එස්.ජී. පතිරගේ මිය	අධ්‍යක්ෂ	❖ ආසියා පැසිපික් විද්‍යුත් ප්‍රසම්පාදන ජාලය	ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන බැංකුව	ඇමෙරිකා
12.	එච්. ඩී. ඩී. පී. කරුණාරත්න මිය	සහකාර අධ්‍යක්ෂ	❖ ආසියා පැසිපික් රටවල් සඳහා Paperless Trade හා Cross Border E- Commerce යන අංශයන් පිළිබඳ සම්මන්ත්‍රණය	ආර්ථික හා වාණිජ උපදේශක කාර්යාලය	චීනය
13	එම්. ජී. ජී. විද්‍යාරත්න මයා	සංවර්ධන නිලධාරි	❖ තිරසාර විද්‍යුත් රාජ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීම		සිංගප්පූරුව
			❖ සංවර්ධනය වෙමින් පවතින රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ව්‍යාපාර සඳහා ආධාර පිළිබඳ සම්මන්ත්‍රණය	ආර්ථික හා වාණිජ උපදේශක කාර්යාලය	චීනය
14.	පී. සී. විමලසූරිය මයා	සංවර්ධන නිලධාරි	❖ "තිරයක් හා මාවතක්" වැඩසටහන යටතේ යටිතල පහසුකම් ඉදිකිරීම් ආයෝජනය හා මූල්‍යකරණය පිළිබඳ සම්මන්ත්‍රණය 2018	-	චීනය
15.	පී. අයි. සන්දීපනී මිය	සංවර්ධන නිලධාරි	❖ ආසියා පැසිපික් රටවල් සඳහා Paperless Trade හා Cross Border E- Commerce යන අංශයන් පිළිබඳ සම්මන්ත්‍රණය	ආර්ථික හා වාණිජ උපදේශක කාර්යාලය	චීනය

6.4.2 දේශීය පුහුණුවීම්

වගු අංක 12 - 2018 වර්ෂයේ දේශීය පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන්

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	පුහුණු ආයතනය	පුහුණු වැඩසටහන	කාලසීමාව	
					සිට	දක්වා
01.	ඊ. ඒ. රත්නසීල මහතා	අධ්‍යක්ෂ	SLIDA	Toastmaster කථන හැකියා පුහුණුව	2018.06.05 සෑම අඟහරුවාදා	සති 10
02.	ජේ. එම්. යූ. පී. ජයමහ මයා	අධ්‍යක්ෂ	SLIDA	Toastmaster කථන හැකියා පුහුණුව	2018.06.05 සෑම අඟහරුවාදා	සති 10
03.	ඩී. එන්. එස්. වැලිකල මිය	අධ්‍යක්ෂ	SLIDA	Toastmaster කථන හැකියා පුහුණුව	2018.06.05 සෑම අඟහරුවාදා	සති 10
			මිලෝදා	මධ්‍ය කාලීන ණය කළමනාකරණ ක්‍රමෝපාය පිළිබඳ ශක්‍යතා ගොඩනැංවීමේ තාක්ෂණය සහාය ලබා දීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ/ ලෝක බැංකුවේ ඒකාබද්ධව පුහුණුව	2018.07.25	2018.08.07
			මිලෝදා	විදේශ ආධාර ව්‍යාපෘති - මූල්‍ය කළමනාකරණය	2018.09.18	2018.09.19
04.	එස්. ජී. පතිරගේ මිය	අධ්‍යක්ෂ	SLIDA	Toastmaster කථන හැකියා පුහුණුව	2018.06.05 සෑම අඟහරුවාදා	සති 10
05.	සී. ඩී. ලියනගේ මිය	සහකාර අධ්‍යක්ෂ	මිලෝදා	රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි	2018.06.18	2018.06.19
			මිලෝදා	රැකියා අරමුණු කරගත් ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව	2018.09.25	සති 36
06.	එස්. වී. වෙත්තසිංහ මිය	සහකාර අධයක්ෂ	මිලෝදා	රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි	2018.06.18	2018.06.19
07	සී. එච්. රණතුංග මිය	සහකාර අධ්‍යක්ෂ	SLIDA	ධාරිතා ගොඩනැඟීමේ පුහුණු වැඩසටහන	2018.10.31	
08.	එච්. ඩී. ආර්. පී.සෙනෙවිරත්න මිය	පරිපාලන නිලධාරි	මිලෝදා	පෞද්ගලික ලිපි ගොණු කළමනාකරණය	2018.06.05	2018.06.06
09.	පී. ඒ. ගුණවර්ධන මිය	මූල්‍ය සහකාර	මිලෝදා	කණිෂ්ඨ විධායක ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	2018.03.09	වසර 01
10.	ඩී. ඒ. සී. ඩී. පී. පිරිස් මෙය	සංවර්ධන නිලධාරි	මිලෝදා	ලිපිගොණු කළමනාකරණය සහ ආයතනික E-Code	2018.06.12	2018.06.14

11.	කේ. එච්. අබේරත්න මයා	සංවර්ධන නිලධාරි	මිලෝදා	රාජ්‍ය අංශයේ මුල්‍ය රෙගුලාසි	2018.11.26	2018.11.28
12.	කේ. එස්. එස්. සෝමරත්න මෙය	සංවර්ධන නිලධාරි	මිලෝදා	ලිඛිත හැකියාවන් වාර්තා කිරීම	2018.08.27	2018.08.28
13.	ඩී. ඩබ්. එන්. ඩී. සුමනවීර මිය	සංවර්ධන නිලධාරි	මිලෝදා	මුල්‍ය ප්‍රකාශ සකස් කිරීම	2018.08.27	2018.08.29
			මිලෝදා	කථන දෙමළ සහතිකපත්‍ර පාඨමාලාව	2018.10.30	2018.1031
14.	එස්. සී. රත්නායක මිය	කළමනාකරණ සහකාර	මිලෝදා	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව	සෑම සෙනසුරාදා	මාස 06
			මිලෝදා	භාණ්ඩ සමීක්ෂණ හා පාඩු හා කපාහැරීම්	2018.08.30	2018.08.31
15.	ඒ. වී. එස්. ආටිගල මිය	කළමනාකරණ සහකාර	මිලෝදා	ලිපිගොණු කළමනාකරණය සහ ආයතනික E-Code	2018.6.12	2018.06.14
15.	පී. අයි.යූ. ප්‍රනාන්දු මිය	කළමනාකරණ සහකාර	මිලෝදා	රාජ්‍ය අංශයේ මුල්‍ය රෙගුලාසි	2018.11.26	2018.11.28
16.	එන්. ඩී.එම්. එස්. කරුණාතිලක මිය	කළමනාකරණ සහකාර	මිලෝදා	මුල්‍ය ප්‍රකාශ සකස් කිරීම	2018.09.19	2018.09.21
			මිලෝදා	කථන දෙමළ සහතිකපත්‍ර පාඨමාලාව	2018.10.30	2018.10.31
17.	ඩී. එස්. ඩබ්. සේරම් මයා	කළමනාකරණ සහකාර	මිලෝදා	ලිපිගොණු කළමනාකරණය සහ ආයතනික E-Code	2018.08.14	2018.08.16
			මිලෝදා	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව	සෑම සෙනසුරාදා	මාස 06

7 මූල්‍ය කළමනාකරණය

2017 වර්ෂය සඳහා ශීර්ෂ අංක: 245 වැඩ සටහන 1, ව්‍යාපෘති 1 යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඒවා උපයෝගී කර ගත් ආකාරය පහතින් දැක්වේ.

වගු අංක 13 - 2018 වර්ෂයේ වියදම්

වියදම් විස්තරය	2017 ශුද්ධ ප්‍රතිපාදන (රු)	2017 සත්‍ය වියදම (රු.)
පුනරාවර්තන වියදම්		47,812,458.15
පුද්ගල පඩිනඩි	48,912,400.00	
වෙනත්	40,380,600.00	34,819,419.45
ප්‍රාග්ධන වියදම්	127,818,800.00	107,401,835.38
මුළු වියදම	217,111,800.00	190,033,712.98

7.1. කාර්යාලය යළි සකස් කිරීම

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු කාර්යාලය රු. මි. 6.18 ක වියදමෙන්, වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කාර්යාල කළමනාකරණයක් අරමුණු කොට ගෙන 2018 වසරේදී අළුතින් සකස් කරන ලදි.

7.2. රාජ්‍ය සේවකයින්ගේ අනුමත අත්තිකාරම් "බී" ගිණුම

2017 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් "බී" ගිණුමෙන් පහත සඳහන් පරිදි නිලධාරීන්ට ණය මුදල් ලබා දී ඇත.

වගු අංක 14 - අත්තිකාරම් "බී" ගිණුම

ණය වර්ගය	නිලධාරීන් ගණන	ගෙවූ මුදල (රු)
ආපදා	42	3,989,782,18
විශේෂ	23	100,000,.00
උත්සව	42	410,000.00
පාපැදි	-	-
ආපදා ණය (ගංවතුර)	-	-
		4,499,782.18